# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,540 - 2008 මාර්තු මස 07 වැනි සිකුරාදා - 2008.03.07

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | -- |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 178 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන | 179 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 180 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 186 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*—(i) ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත, 2008 ජනවාරි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) 2004 අංක 11 දරන මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත, 2008 ජනවාරි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) 2005 අංක 05 දරන මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත, 2005 ජනවාරි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 මාර්තු මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 පෙබරවාරි මස 29 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 134

D/RF/824/NY/04/04.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

*2007 ජනවාරි මස 15 වැනි දින සිට කොමදෝරු (ඉ) වශයෙන් :*

කපිතාන් (ඉ) [තාවකාලික කොමදෝරු (ඉ)] හේරත් මුදියන්සේලාගේ සෝමතිලක, එස්එල්එන්, එන්ආර්ඊ - 0275.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

03-86

---

2008 අංක 135

D/RF/824/NY/03/02.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

*2007 ජනවාරි මස 01 දින සිට කපිතාන් (ඉ) වශයෙන් :*

කොමාණ්ඩර් (ඉ) [තාවකාලික කපිතාන් (ඉ)] (අධිකාරි මුදියන්සේලාගේ ජයන්ත තිලක්සිරි, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 0548.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

03-83

---

2008 අංක 136

D/RF/824/NY/4/04.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීම්

*2007 ජනවාරි මස 01 දින සිට තාවකාලික කපිතාන් වශයෙන් :*

කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) [තාවකාලික කපිතාන් (ඒඑස්ඩබ්)] නිරාජ පණ්ඩුල ශ්‍රීපති ආටිගල, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0256 ;
කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) [තාවකාලික කපිතාන් (ඒඑස්ඩබ්)] සමරවීර මුදලිගේ දොන් කපිල සමරවීර, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0254 ;
කොමාණ්ඩර් (සංඥා) [තාවකාලික කපිතාන් (සංඥා)] අගලවත්ත අශෝක ප්‍රින්ස්ලි ලියනගේ, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0341 ;
කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) [තාවකාලික කපිතාන් (ඒඑස්ඩබ්)] ප්‍රියංක මෙරිල් වික්‍රමසිංහ, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0260.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

03-84

---

2008 අංක 137

D/22/NY/416.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 නොවැම්බර් මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ලුතිනන් කොමාණ්ඩර් (සැ) විජේමුණි අරුණ සුජීව ද සිල්වා, එන්ආර්එස් 0424, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

03-85

2008 අංක 138

D/RF/824/NY/1/6.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2003 දෙසැම්බර් මස 14 වැනි දින සිට වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

වෛද්‍ය ලුතිනන් මානික්ක බදුගේ ප්‍රභාත් චින්තක විජේදාස, එන්ආර්එම්, 0851, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

03-157

2008 අංක 139

D/RF/824/NY/1/6.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2007 ඔක්තෝබර් මස 07 වැනි දින සිට වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර් (දන්ත) වශයෙන් :*

වෛද්‍ය ලුතිනන් (දන්ත) හේරත් මුදියන්සේලාගේ ආරියවංශ හේරත්, එන්ආර්ඩී 1616, ශ්‍රීලංනාහ ;
වෛද්‍ය ලුතිනන් (දන්ත) රත්නායක මුදියන්සේලාගේ රුවන් කුමාර චන්ද්‍රසිරි, එන්ආර්ඩී 1617, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 දෙසැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

03-158

# ආණ්ඩුවේ නිවේදන

## සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන සහ 4වන වගන්ති වලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍ය සුමිත්‍ර ආරච්චිගේ දොන් බන්දුල චන්ද්‍රසිරි ගුණවර්ධන වන මම, මෙම නිවේදනයෙන්,

1. කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, 67 බී දරන ස්ථානයේ පිහිටි "මහජන බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය" නමැති සමිතිය, සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි.

2. සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනතේ අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

සුමිත්‍ර ආරච්චිගේ දොන් බන්දුල චන්ද්‍රසිරි ගුණවර්ධන,
වෙළඳ, අලෙවි, සංවර්ධන, සමුපකාර
හා පාරිභෝගික සේවා අමාත්‍ය.

2008 පෙබරවාරි මස 12 වැනි දින,
වෙළඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය,
අංක 330, යූනියන් පෙදෙස,
කොළඹ 02.

03-56

## පුරාවස්තු ආඥාපනත

16 වන වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 16 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජාතික උරුමයන් පිළිබඳ වැඩබලන අමාත්‍ය ගරු මහින්ද යාපා අබේවර්ධන වන මා විසින්, මේ උපලේඛනයේ විස්තර කර ඇති ස්මාරක, ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා පැරණි ස්මාරක ලෙස සලකනු ලැබිය යුතු බවට, මේ නියමය මගින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහින්ද යාපා අබේවර්ධන,
ජාතික උරුමයන් පිළිබඳ වැඩබලන අමාත්‍ය.

2008 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප්පූරාල් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සිනාන්වැලි ග්‍රාමයට අයත් ලංකා පට්ටන සමුද්‍රගිරි විහාර භූමියේ ඇති පැරණි දාගැබ, පැරණි නටබුන් වූ පොකුණ, ඕවලාකාර හා ආයත චතුරස්‍රාකාර ගල්කටු සිදුරු සහ පනාබැම්.

2. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනේතිව් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කල්අඩි පාෂාණ පබ්බත විහාර භූමියේ ඇති නටබුන් වූ දාගැබ, පර්වත ශිලා ලිපි හය, ගලේ කෙටූ පැරණි පඩි පේළි සහ පනාබැම්.

03-49

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

**2006 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය**

| | 2005 (රු.) | | 2006 (රු.) | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| (අ) ඉඩම් හා ගොඩනැගිලි | 1,417,737 | | 1,946,851 | |
| (ආ) ලීබඩු සහ කාර්යාල උපකරණ | 2,915,675 | | 4,767,644 | |
| (ඇ) පුස්තකාල පොත් සහ වාර සඟරා | 553,552 | | 692,514 | |
| (ඈ) මෝටර් රථ | 67,070 | | 38,258 | |
| (ඉ) පුනරුත්ථාපන හා නඩත්තු-ගොඩනැගිලි | 441,177 | 5,395,211 | 61,689 | 7,506,956 |
| **ආයෝජන** | | **7,511,466** | | **6,043,993** |
| **ජංගම වත්කම්** | | | | |
| (අ) තොග | 377,033 | | 384,936 | |
| (ආ) සේවක ණය හා අත්තිකාරම් | 3,123,881 | | 3,404,239 | |
| (ඇ) විවිධ අත්තිකාරම් | 224,838 | | 255,444 | |
| (ඈ) පූර්ව ගෙවීම් | 43,789 | | 71,836 | |
| (ඉ) වැඩිපුර ගෙවීම් | 41,886 | | 23,111 | |
| (ඊ) යෝජිත ස්වයංමූල්‍ය පාඨමාලා ප්‍රා. වියදම් | | | 192,861 | |
| (උ) වෙනත් | 282,880 | | 576,686 | |
| (ඌ) මුදල් හා මුදල් සමාන දේ | 1,656,195 | 5,750,502 | 1,307,184 | 6,216,297 |
| **වත්කම්වල එකතුව** | | **18,657,179** | | **19,767,246** |
| **ස්කන්ධ සහ බැරකම් ප්‍රාග්ධන** | | | | |
| (අ) වැයකළ ප්‍රාග්ධනය | 17,038,538 | | 18,432,043 | |
| (ආ) වැය නොකළ ප්‍රාග්ධනය | 406,806 | | 413,301 | |
| (ඇ) ත්‍යාග හා පරිත්‍යාග | 349,465 | | 351,440 | |
| (ඈ) ප්‍රාග්ධනයට දායකත්වය- | | | | |
| (i) ආයතන ආදායමින් හා පොදු සංචිතයෙන් | 160,373 | | 160,373 | |
| (ii) කෙටිකාලීන පාඨමාලා ආදායමින් | 3,741,317 | | 3,962,182 | |
| (iii) මා. ස. අ. ආයතන සංවර්ධන අරමුදලින් | 479,551 | | 996,830 | |
| (iv) තොරතුරු තාක්ෂණ අරමුදලින් | 500,000 | 22,676,050 | 1,899,087 | 26,215,256 |
| **සමුච්චිත අරමුදල** | | | | |
| පොදු සංචිතය | (17,669,419) | | (21,449,954) | |
| ආදායම් වියදම් ගිණුම | (3,844,514) | (21,513,933) | (1,531,739) | (22,981,693) |
| **ශේෂය ඉ/ගෙ** | | **1,162,117** | | **3,233,563** |
| **සංචිත සහ නිශ්චිත අරමුදල්** | | | | |
| (අ) ත්‍යාග මුදල් දීමේ අරමුදල | 46,000 | | 8,500 | |
| (ආ) උරුමක්කාර අරමුදල | 9,000 | | 9,000 | |
| (ඇ) මා. ස. අ. ආයතන සංවර්ධන අරමුදල | 753,642 | | 832,897 | |

| | | 2005 (රු.) | | 2006 (රු.) | |
|---|---|---|---|---|---|
| (ඈ) | ගොඩනැගිලි අරමුදල | 1,502,125 | | 20,000 | |
| (ඉ) | තාක්ෂණ අරමුදල | - | | 912 | |
| (ඊ) | වෙනත් ස්වයං මූල්‍ය පාඨමාලා | 8,075,051 | - | 1,075,917 | |
| (උ) | ස්වයං මූල්‍ය පාඨමාලා - (හර ශේෂය) | - | 10,385,818 | (59,682) | 1,887,544 |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | | 4,985,308 | | 6,944,697 |
| **ජංගම බැරකම්** | | | | | |
| (අ) | ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 1,182,042 | | 5,754,267 | |
| (ආ) | උපචිත වියදම් | 216,832 | | 196,231 | |
| (ඇ) | ගෙවිය යුතු තැන්පතු | 626,878 | | 960,180 | |
| (ඈ) | අගරු වූ චෙක්පත් ගිණුම | 19,380 | | 34,385 | |
| (ඉ) | විගණන ගාස්තු ප්‍රතිපාදන | 65,000 | | 130,000 | |
| (ඊ) | හඳුනා නොගත් ආදායම් | | | 625,050 | |
| (උ) | වෙනත් | 13,804 | 2,123,936 | 1,329 | 7,701,442 |
| **මුළු බැරකම්** | | | **18,657,179** | | **19,767,246** |

නිවැරදි බවට සහතික කරමු.

**ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම,**
අධ්‍යක්ෂ.

**එන්. විජයවර්ධන,**
නියෝජ්‍ය මූල්‍යාධිකාරී.

***2006.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම***

*(වටිනාකම ආසන්න රුපියලට ගලපා ඇත)*

| **ආදායම්** | | 2005 (රු.) | | 2006 (රු.) | |
|---|---|---|---|---|---|
| 01. | රජයේ ආධාර- | | | | |
| | (අ) රජයේ ආධාර (පුනරාවර්තන) | 11,800,000 | | 15,480,000 | |
| | (ආ) රජයේ ආධාර ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණ හා නඩත්තු | - | | - | |
| | (ඇ) මහපොළ ශිෂ්‍යාධාර සඳහා ආධාර | 373,100 | | | |
| | (ඈ) හිඟ වැටුප් ගෙවීම සඳහා වි. වි. ප්‍ර. කො සභාවෙන් ආධාර | - | 12,173,100 | | |
| | (ඉ) මා. ස. අ. ආ. ගොඩනැගිලි අරමුදලින් ලබාගත් අරමුදල් | - | | 1,770,335 | 17,250,335 |
| 02. | ලියාපදිංචි ගාස්තු ප්‍රථම උපාධි | 300,500 | | 358,500 | |
| 03. | ශිෂ්‍ය ගාස්තු | - | | 157,680 | |
| 04. | පරිගණක පාඨමාලා ගාස්තු | 27,300 | | 17,740 | |
| 05. | විභාග ගාස්තු | 37,555 | | 21,675 | |
| 06. | ණය හා අත්තිකාරම් පොළී | 114,541 | | 126,250 | |
| 07. | ආයෝජන පොළී | 212,621 | | 365,529 | |
| 08. | පරණ භාණ්ඩ විකිණීම | 1,476 | | 4,839 | |
| 09. | ප්‍රකාශන විකිණීම | 1,150 | | 500 | |
| 10. | පුස්තකාල දඩ | 4,982 | | 7,142 | |
| 11. | ව්‍යාපාරික කටයුතුවලින් | 14,472 | | 6,928 | |
| 12. | සුළු මිශ්‍ර ආදායම් | 192,197 | | 350,982 | |
| 13. | වැඩමුළු ආදායම් | - | | 14,589 | |
| 14. | ගර්හිත භාණ්ඩ අපහරණ ලාභය | 1,133 | | - | |
| 15. | පොදු වක්‍රලේඛ 850 ලැබීම් ගිණුම | - | | - | |
| 16. | උපාධි ලෝගු කුලිය | 66,850 | | 73,125 | |
| 17. | කෙටිකාලීන පාඨමාලා ලැබීම් ගිණුම | 11,205,187 | 12,179,964 | 17,467,609 | 18,973,088 |

| | | *2005 (රු.)* | | *2006 (රු.)* |
|---|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | | 24,353,064 | | 36,223,423 |
| **වියදම** | | | | |
| 01. **පෞද්ගලික පඩි නඩි :** | | | | |
| වැටුප් හා වේතන | 6,072,051 | | 10,493,372 | |
| වි. අ. අ. /සේ. භා. අ. විශ්‍රාම වැටුප් | 1,148,656 | | 1,841,736 | |
| දීමනා | 2,948,128 | | 1,145,055 | |
| අතිකාල/නිවාඩු දින ගෙවීම් | - <br> 594,836 | | - <br> 1,042,926 | |
| බාහිර කථිකාචාර්ය ගෙවීම් | 941,793 | | 1,087,037 | |
| 02. ගමන් වියදම් | 28,882 | | 8,691 | |
| 03. සැපයීම් | 699,190 | | 691,376 | |
| 04. නඩත්තු | 329,147 | | 291,078 | |
| 05. කොන්ත්‍රාත්තුමය සේවා | 1,280,866 | | 1,433,436 | |
| 06. පර්යේෂණ | - | | - | |
| 07. වෙනත් | 690,787 | | 702,196 | |
| 08. මහපොළ ශිෂ්‍යත්ව | 373,100 | | - | |
| 09. ක්ෂය කිරීම් | 1,484,218 | | 1,540,390 | |
| 10. පාරිතෝෂික දීමනා | 1,419,281 | | 1,959,389 | |
| 11. කෙටිකාලීන පාඨමාලා වියදම් | 10,016,972 | | 15,518,480 | |
| 12. යෝජිත ගාස්තු අයකරන පාඨමාලා සඳහා අත්තිකාරම් | 169,672 | 28.197,579 | - | 37,755,162 |
| **ආදායමට වැඩි වියදම** | | **(3,844,515)** | | **(1,531,739)** |
| **ආදායම් හා වියදම් විසර්ජන ගිණුම** | | | | |
| ආදායම් වියදම් ගිණුමේ ශේෂය ඉදිරියට ගෙනාවා | | (3,844,515) | | (1,531,739) |
| ආදායම් වියදම් ගිණුමේ ශේෂය | | (17,055,210) | | (21,513,932) |
| පසුගිය වර්ෂයේ ගැලපීම | | (614,208) | | 63,978 |
| ශේෂය ශේෂ පත්‍රයට ගෙන ගියා | | **(21,513,933)** | | **(22,981,693)** |

**මුල්‍ය ප්‍රකාශනය සඳහා ගිණුම් සටහන්**

01. *පොදු ගිණුම් ප්‍රතිපත්ති*

1.1 මුල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත හා ශ්‍රී ලංකාවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව පිළියෙල කර ඇත.

1.2 සියලුම වගකීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන කර ඇත.

1.3 පාඨමාලා ආදායම් හා වියදම් මුදල් පදනම මත ගිණුම් ගත කර ඇත. අදාළ ගිණුම වර්ෂය තුළ දී කර ඇති වියදම්වලට සමාන මුදල් ප්‍රමාණයක් ආදායමට ගෙන ඇත. ඉතිරි පාඨමාලා ආදායම් ජංගම බැරකම් යටතේ දක්වා ඇත.

1.4 පාඨමාලාවල ශුද්ධ ප්‍රතිඵලය පාඨමාලාව අවසානයේ දී හඳුනා ගැනීම කරනු ඇත.

02. *වත්කම් සහ ඒවායේ වටිනාකම් තක්සේරු කිරීමේ පදනම*

2.1 ක්ෂය කළ යුතු වත්කම්වල ලෙජර් ශේෂය මත ක්ෂය ප්‍රතිපාදන සලසා ඇත.

2.2 ස්ථාවර වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර පෙන්වා ඇත. පහත සඳහන් ක්ෂය අනුපාතයන් මත සඵල ආයු කාලය තුල සරල මාර්ග ක්‍රමයට ක්ෂය වත්කම්වල ගණනය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ලී බඩු සහ කාර්යාලයීය උපකරණ | 10%-20% |
| වාහන | 20% |
| පරිගණක යන්ත්‍ර | 20% |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 20% |
| වෙනත් වත්කම් | 10%-20% |

2.3 තොග වටිනාකම ලෙස ලෙජර් ශේෂය ගිණුම්වල දක්වා ඇත.

03. *බැරකම් හා වෙන් කිරීම්*

3.1 සේවයට සම්බන්ධ වූ මුල් වර්ෂයේ සිට සියළුම සේවකයන්ට අස්වීමේ දී ගෙවන පාරිතෝෂික මුදල් වෙනුවෙන් ගිණුම් තබා ඇත. මෙම වෙන් කිරීම සඳහා බාහිර අරමුදලක් පිහිටුවා නැති අතර භාණ්ඩාගාරය විසින් ලබාදෙන මුදල්වලින් ගෙවීම් සිදු කර ඇත.

මගේ අංකය : සීර්/සී/අයිඑච්ආර්ජ්/06/එෆ්/ඒ.
අධ්‍යක්ෂ,
කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනය.

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාර පනවන ලද 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3),(4) සහ (7) උපවගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 විගණන විෂය පථය

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවලින් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේ ද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනය 2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2006 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්ව විද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් උක්ත පොත්පත්වලට එකඟව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට සහ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සහ මූල්‍ය ප්‍රකාශන සමග දී ඇති උපලේඛන (බී-1 සිට බී-21 හා පී-1 සිට පී-6දක්වා) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 *ගණකාධිකරණ අඩුපාඩු*

ස්වයං මූල්‍ය පාඨමාලා ගිණුමට 2006 වර්ෂයේ දී බැංකුව විසින් බැර කර තිබුණු රු. 625.050 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකර එම මුදල හඳුනා නොගත් බැරකමක් ලෙස පෙන්වා තිබුණි.

2.2.2 *ලැබිය යුතු ගිණුම්*

විවිධ අත්තිකාරම් ගිණුම් යටතේ වර්ෂ 10කට වඩා පැරණි පියවා නොතිබුණු රු. 226,741ක් වූ අත්තිකාරම් විය.

2.2.3 *නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම*

නීති, රීති රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| *නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව* | *අනුකූල නොවීම්* |
|---|---|
| (අ) 2005 අප්‍රේල් මස 26දින හා අංක 861 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | (i) අංක 24 දරන ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාවේ අවසාන පරීක්ෂණයේ විභාග රාජකාරි වලට සහභාගිවූ කාර්ය මණ්ඩලයේ 58 දෙනෙකුට ගෙවිය හැකි ගාස්තුව වූ රු. 25,925 වෙනුවට රු. 186,350 ගෙවා තිබුණු බැවින් රු. 160,425ක් වැඩිපුර ගෙවා තිබුණි.<br><br>(ii) අංක 24 හා 25 දරන ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව හා අංක 02 හා අංක 03 දරන ගුරුවරුන් සඳහා වන ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව සම්බන්ධයෙන් වූ විභාග කටයුතු සඳහා චක්‍රලේඛයට පටහැනිව ගෙවීම් කර තිබුණි. මේ පිළිබඳව ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ පිළිතුර පහත දැක්වේ. "මෙම සියළුම විභාග පවත්වා ඇත්තේ සති අන්ත නිවාඩු දිනවල වන අතර චක්‍රලේඛ අංක 861 අනුව සියළුම කාර්ය මණ්ඩලයේ අයට චක්‍රලේඛයේ සඳහන් දීමනා වලට අමතරව රජයේ අනුමත අතිකාල දීමනා හෝ නිවාඩු දින දීමනා වලට හිමිකම් ඇත. මෙම චක්‍රලේඛයට අනුකූලවන ලෙස සැකසූ ගාස්තු ප්‍රමාණ උපයන ලද මුදලින් ගෙවීමට ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව අනුමත කර ඇත." |
| (ආ) රජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු. රෙ. 756 | 2002 වර්ෂයෙන් පසුව රු. 2,996,022ක් වූ පුස්තකාල පොත් හා වාර සඟරා සම්බන්ධව සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ii) මු.රෙ. 880 | මුදල් භාරව කටයුතු කරන නිලධාරියාගෙන් ඇප මුදලක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2.2.4 *මතභේදයට තුඩුදෙන ගනුදෙනු*

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛය ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් 2006 වර්ෂයේ දී රු. 126,164ක් ගෙවාතිබුණි.

(ආ) 1994 ජුනි මස 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව දීර්ඝ කාලීන සේවා දීමනා ලෙස රු. 10,000ක් ද, නිලධාරියෙකුට ගෞරවාන්විත දීමනාවක් ලෙස රු. 18,000ක් ද, ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලා අංක 24 සඳහා නිලධාරීන්ගේ දිරි දීමනා ලෙස රු. 200,350 ක් ද ගෙවා තිබුණි. තව ද ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවට සිසුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වලට රජයේ නිවාඩු දින බාහිරින් පැමිණි නිලධාරීන් හයදෙනෙකුට රු. 27,500ක් ද, ඊට සහභාගිවූ ආයතනයේ කාර්ය මණ්ඩලයේ අට දෙනෙකුට රු. 38,500ක් ද ගෙවා තිබුණි.

3. **මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය**

3.1 *මූල්‍ය ප්‍රතිඵල*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතු වල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 17,011,739ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූප ඌනතාවය රු. 15,644,515ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු. 15,480 000ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු. 1,531,739 ක් දක්වා අඩු විය. ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 11,800,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂය සඳහා ඌනතාවය රු 3,844,515ක් දක්වා අඩුවී තිබුණි.

3.2 *කාර්ය සාධනය*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රධාන උපාධි පාඨමාලාව වන ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා 2006 වර්ෂයේ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 712ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සිසුන් 88 කගේ වැඩිවීමක් විය. 2006 වර්ෂයේ පවත්වන ලද විභාගවලින් එක් විභාගයක ප්‍රතිඵල හැර අනෙක් විභාග වල ප්‍රතිඵල මාස 03ක් ඉකුත්වී තිබුණ ද නිකුත් කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂය තුළදී මුදල් අය කිරීමේ පාඨමාලා 05ක් පවත්වා තිබුණ අතර ඒ සඳහා සහභාගි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2,778ක් විය. විභාගයන්ට පෙනී නොසිටි ශිෂ්‍ය සංඛ්‍යාව 187 ක් වූ අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 7%ක් විය. අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 132ක් වූ අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 5%ක් විය.

(ඇ) මුදල් අය කිරීමේ පාඨමාලා ගාස්තු වශයෙන් රු. 10,355,000ක් 2006 වර්ෂය තුළ ලැබුණු අතර එය ඉකුත් වර්ෂය හා සසඳන විට 4%ක අඩුවීමක් විය.

(ඈ) ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා 2006 වර්ෂයේ දී වෙන් කරන ලද පැය ගණන පැය 3,075 ක්වූ අතර පැවැත්වූ මුළු දේශන පැය ගණන පැය 2,810 ක් විය. මෙය 91%ක ප්‍රතිශතයකි. පවත්වන ලද දේශන පැය ගණනින් පැය 445ක් ආයතනයේ අභ්‍යන්තර දේශකයින් දෙදෙනා විසින් ද පැය 2,365ක් බාහිර දේශකයින් විසින් ද පවත්වා තිබුණි. මේ අනුව මුළු දේශන පැය ගණනින් අභ්‍යන්තර දේශකයින් පවත්වා තිබුණ දේශය පැය ප්‍රමාණය 16%ක් විය. එසේම බාහිර දේශකයින් සඳහා දැරූ මුළු පිරිවැය රු. 1,060,856ක්වූ අතර එක් බාහිර දේශන පැයක සාමාන්‍ය පිරිවැය රු. 449ක් විය.

(ඉ) මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ අධ්‍යයන ඩිප්ලෝමා පාඨාමාලාවේ අංක 02 හා අංක 03ට අදාළව කථිකාචාර්යවරයකුට පත්වීම් ලබාදීමේ දී උපරිම දේශන පැය 50ක කාලසීමාවක් ලබා දී තිබුණු අතර අවම වශයෙන් පැය 13ක්වත් දේශන පැවැත්විය යුතු විය. මෙම පාඨමාලාව සඳහා අධ්‍යයන කාල සටහනක් උපයෝගී කර නොතිබුණු අතර කිසිදු දේශකයකු සඳහා නිශ්චිත දේශන පැය ප්‍රමාණයක් වෙන් කර නොතිබුණි. එසේ ම මෙම පාඨමාලාවේ බාහිර කථිකාචාර්ය මණ්ඩලයේ 13ක් අතරින් එක් කථිකාචාර්යවරයෙකු හැර අනෙක් කථිකාචාර්යවරුන් විසින් පැය 50කට ප්‍රමාණවත් දේශන පවත්වා නොතිබුණු අතර පැය 13කට අඩුවෙන් දේශන පවත්වා තිබුණු කථිකාචාර්යවරුන් සංඛ්‍යාව තිදෙනෙකු විය.

3.3 *අවිධිමත් ගෙවීම්*

ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවට අදාළ පාඩම් සකස් කිරීම හා සංශෝධනය කිරීම වෙනුවෙන් රු. 154,500ක් වැය කර තිබුණ නමුත් එම ගෙවීමට අදාළ පාඩම් පාඨමාලා හා මීට පෙර එම සමායෝජක විසින් සකස් කර තිබුණු පාඩම් පාඨමාලා අතර සැලකිය යුතු තරමේ වෙනස් කිරීම් හෝ සංශෝධනය කිරීම් කර නොතිබුණි.

3.4 *අයවැය ලේඛනයමය පාලනය*

2006 වර්ෂයේ අයවැය ලේඛනයෙහි ඇතුළත් ඇතැම් විෂයයන් සඳහා ඇස්තමේන්තු කළ වියදම/ආදායම හා තථ්‍ය වියදම/ආදායම අතර සැලකිය යුතු විචලනයක් තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අත්තිකාරම්
(ආ) පාඨමාලා දේශන පැය
(ඇ) පාඨමාලා කටයුතු සඳහා ගෙවීම්

පී. ඒ. පේමතිලක,
විගණකාධිපති.

03-14

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 04/0/00/00343.

ණයකරුගේ සම්පූර්ණ නම : දිසානායක මුදියන්සේලාගේ ලලිත් කුමාර ටැම්පිටිය.

නාවලපිටිය ප්‍රසිද්ධ නොතාරිස් වී. පරම්සෝදි විසින් ලියා සහතික කරන ලද අංක 887 හා 1997.11.15 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ එක්දහස් අටසිය අනූහතයි ශත අනූහත (රු. 1,01,897.97)ක මුදලක් වර්ෂ 2003.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූඑක් දහස් නවසිය හතලිස් පහයි ශත හැත්තෑ හතර (රු. 91,945.74) මුදල ද වර්ෂ 2003.07.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් නවදහස් නවසිය පනස් දෙකයි ශත විසිතුන (රු. 9,952.23) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ එක්දහස් අටසිය අනූහතයි ශත අනූහත (රු. 1,01,897.97) ද,

(2) එකී රුපියල් අනූඑක් දහස් නවසිය හතලිස් පහයි ශත හැත්තෑ හතර (රු. 91,945.74) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2003.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ තිස්පොනේ කෝරළේ, මල්ලන්ද ග්‍රාමයෙහි පිහිටි ලෝවර් ඩොන්සයිඩ් එස්ටේට් නමැති ඉඩමට 1997.05.26 දින පී. ඥාණසේකරම් මානක තැන විසින් මැන සම්පාදිත අංක 5217 පිඹුර ප්‍රකාර මායිම්, ඊසානට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පාර, ගිණිකොණට : මෙම ඉඩමේ ඉතිරි කොටස, නිරිතට : මෙම ඉඩමේ ඉතිරි කොටස, වයඹට : පිඹුරු අංක 3692ට අනුව ලෝවර් ඩොන්සයිඩ් එස්ටේට්හි ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි පර්චස් දහසයයි දශම පහයි බින්දුවක (අ. 0, රූ. 0, පර්. 16.50) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කියූ. 151/231හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2003ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

03-132

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0415500010 සහ 0410000001.

ණයකරුගේ සම්පූර්ණ නම : ඉහළ ගෙදර කරුණාරත්න.

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. එම්. කොස්වත්ත විසින් ලියා සහතික කරන ලද අංක 2687, 2686 හා 2004.06.15 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ විසිපන්දහස් හාරසිය අනූඑකයි ශත දහනමයක (රු. 3,25,491.19) මුදලක් වර්ෂ 2006.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තුන්ලක්ෂ එක්දහස් තුන්සිය හැටහතරයි ශත හැත්තෑතුනක (රු. 3,01,364.73) මුදල ද වර්ෂ 2006.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිහතරදහස් එකසිය විසිහයයි ශත හතලිස්හයක් (රු. 24,126.46) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ විසිපන්දහස් හාරසිය අනූඑකයි ශත දහනමයක (රු. 3,25,491.19) ද,

(2) එකී රුපියල් තුන්ලක්ෂ එක්දහස් තුන්සිය හැටහතරයි ශත හැත්තෑතුනක (රු. 3,01,364.73) මුදල මත අයවිය යුතු වර්ෂයකට 9.50%, 12.50% බැගින් වන පොළියක් 2006.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ මාර්තු මස 28 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ කන්දපල්ල කෝරළේ, ගලේවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, මීවල පතහ ග්‍රාමයෙහි පිහිටි මීවල පතහ නැමැති ඉඩමට 2000.11.11 දින ලියනගේ සිරිපාල මානක තැන විසින් මැන සම්පාදිත අංක 874 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, ඊසානට : දිග්ගල සිට මීවල පතහ දක්වා වූ පාර ද, ගිණිකොණට: පී. ජී. නවරත්නට අයත් ඉඩම ද, නිරිතට එච්. එම්. විජේසිංහට අයත් ඉඩම ද, වයඹට: එච්. ඒ. ධර්මදාසට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි අක්කර එකයි පර්චස් හතක (අ. 1, රූ. 0, පර්. 7) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ./ඩී 92/237හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

03-134

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0300001028.

ණයකරුගේ සම්පූර්ණ නම : රුහුණු කංකානමගේ ප්‍රසාන්ති ඩිල්මිණි ප්‍රනාන්දු සහ ඉලේකුට්ටිගේ ඇන්ටනි සමන්ත ප්‍රනාන්දු.

මතුගම සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එච්. එම්. ඩී. බණ්ඩාර සහ එස්. ජේ. අමදෝරු විසින් ලියා සහතික කරන ලද අංක 18 සහ 418 හා 1998.05.02 සහ 1999.08.14 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හාරදහස් දෙසිය අසූවයි ශත හතලිස්හතක (රු. 2,04,280.47) මුදලක් වර්ෂ 2004.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හැත්තෑහයදහස් හත්සිය තිස්නවයයි ශත අසූතුනක් (රු. 1,76,739.83) මුදල ද වර්ෂ 2004.07.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිහත්දහස් පන්සිය හතලිහයි ශත හැටහතරක් (රු. 27,540.64) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හාරදහස් දෙසිය අසූවයි ශත හතලිස්හතක (රු. 2,04,280.17) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හැත්තෑහයදහස් හත්සිය තිස්නවයයි ශත අසූතුනක් (රු. 1,76,739.83) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.50% බැගින් වන පොළියක් 2004.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, වාද්දු වස්කඩු දෙබැද්දෙහි පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ, තල්පිටිය *හෙවත්* මහවාද්දුව ග්‍රාමයේ හි ගාළු පාරේ වරිපනම් අංක 436/1හි පිහිටි නවසිගහවත්ත *හෙවත්* කරදගහවත්ත නැමැති ඉඩමට 1997.11.13 දින ජේ. ඩබ්. රොඩ්රිගෝ මානක තැන විසින් මැන සම්පාදිත අංක 1792 පිඹුර ප්‍රකාර ලොට් 01ට මායිම්, උතුරට : අඩි දහයක් පළල පාර (පිඹුරු අංක 1574හි ලොට් 2 සහ 06) ද, නැගෙනහිරට : එස්. ප්‍රනාන්දුට අයත් දේපළ ද, දකුණට : එස්. ප්‍රනාන්දුට අයත් දේපළ හා පිඹුරු අංක 1574හි දැක්වෙන ලොට් 4 ද, බටහිරට : සී. පෙරේරාට අයත් දේපළ ද යන මායිම් තුල පිහිටි පර්චස් එකොළහයි දශම හතයි හයක (අ. 0, රූ. 0, පර්. 11.76) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 119/210 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

03-135

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1900001952 සහ 1900002116.

ණයකරුගේ සම්පූර්ණ නම : බාලසූරිය මුදියන්සේලාගේ පොඩිඅප්පුහාමි.

මහවැව ප්‍රසිද්ධ නොතාරිස් පී. සී. විජේසිංහ සහ එස්. එම්. දැල්ලව විසින් ලියා සහතික කරන ලද අංක 822, 518 හා 2000.01.26, 2000.08.30 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ විසිපන්දහස් එකසිය හතලිස්හයයි ශත අසූහතරක (රු. 3,25,146.84) මුදලක් වර්ෂ 2007.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ අසූනවදහස් අටසිය හැටඑකයි ශත අසූඅටක (රු. 2,89,861.88) මුදල ද වර්ෂ 2007.06.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්පන්දහස් දෙසිය අසූහතරයි ශත අනූහයක් (රු. 35,284.96) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ විසිපන්දහස් එකසිය හතලිස්හයයි ශත අසූහතරක (රු. 3,25,146.84) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ අසූනවදහස් අටසිය හැටඑකයි ශත අසූඅටක (රු. 2,89,861.88) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2007.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ අගෝස්තු මස 27 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උතුරු යටිකහ කෝරළේ, කටුගම්පොළ හත්පත්තුවේ කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාශයේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාවේ දූනුකෙයියාවත්ත ග්‍රාමයේ දංගහමුලහේන පිල්ලෑව නමැති ඉඩමට 1999.02.26 දින එස්. එම්. දිසානායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 7080 පිඹුර ප්‍රකාර ලොට් 2 සහ 3ට මායිම්, උතුරට : මූනමල්දෙනිය සිට කටුපොතට ඇති ප්‍රධාන පාර ද, නැගෙනහිරට : බී. එම්. ජයතුහාමි හිමිකම් කියන ඉඩම ද, දකුණට : එච්. බී. බාලසූරිය හිමිකම් කියන ඉඩම ද, බටහිරට : එම පිඹුරේම ලොට් 01 ද, යන මායිම් තුළ පිහිටි රූඩ් තුනක් (අ. 0, රූ. 3, පර්. 0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමග කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J110/268හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

03-133

---

එන්(පීවීඑස්)27525.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394(3) වගන්තිය යටතේ "යූආන් මෙං චයිනීස් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2000.12.07 දින සංස්ථාපිත සමාගමක් වන යූආන් මෙං චයිනීස් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, යූආන් මෙං චයිනීස් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-12

---

පීවීඑස්5328.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394(3) වගන්තිය යටතේ "කලම්බු ට්‍රාන්ස්ෂිප්මන්ට් ඇන්ඩ් ට්‍රේඩිං ලිමිටඩ්" නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥා පනතේ (145 වැනි අධිකාරය) විධිවිධාන යටතේ 1978.10.20 දින සංස්ථාපිත සමාගමක් වන කලම්බු ට්‍රාන්ස්ෂිප්මන්ට් ඇන්ඩ් ට්‍රේඩිං

ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, කලම්බු ට්‍රාන්ස්ෂිප්මන්ට් ඇන්ඩ් ට්‍රේඩිං ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-11

---

එන්(පීවීඑස්)24407.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ඕ එස් ෆ්‍රෙෂ් චේන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1999.08.27 දින සංස්ථාපිත සමාගමක් වන ඕ එස් ෆ්‍රෙෂ් චේන් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, ඕ එස් ෆ්‍රෙෂ් චේන් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-08

---

පීවීඑස් 4702.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ධාර්සිං සන්ස් ලිමිටඩ්" නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥා පනතේ (145 වැනි අධිකාරය) විධිවිධාන යටතේ 1977.04.22 දින සංස්ථාපිත සමාගමක් වන ධාර්සිං සන්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, ධාර්සිං සන්ස් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-09

---

**රුහුණ සංවර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති *විශේෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනුලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2007.11.28 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එ. ගී. විදානපතිරණ මයා විසින් සහතික කරන ලද 2006.03.02 දිනැති අංක 5473 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැලවත්ත, ගලගම (උතුර) නාකුළුගමුව ලිපිනයේ පදිංචි ජයවර්ධන විදානපතිරණගේ චමින්ද ජයවර්ධන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හයලක්ෂ අසූතුන්දහස් හත්සිය අනූඑකක (රු.6,83,791) ක මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2007.07.08 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් හයලක්ෂ අසූතුන්දහස් හත්සිය අනූඑකක මුදල සඳහා (683,791) වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 5473 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

**උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර**

***පළමු උපලේඛනය***

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවාපත්තුවේ, ගලගම පිහිටි පැලවත්තට මායිම්, උතුරට: අබේසේකර ලියනගේ වත්තුහාමි පදිංචි වත්තේ වැටද, නැගෙනහිරට: කුඩාවැවේ අත්මග ලුණුවැරණිය පඳුර සහ ලියන් පඳුරද, දකුණට: කම්මල්වල දෙනිය ද, බස්නාහිරට: උඩරට

ගෙවත්ත ද යන මෙහි තුළ කුරක්කන් කුරුණි තුනක් *හෙවත්* කුරක්කන් කුරුණි එකහමාරක් පමණ වපසරිය ඇති ඉඩම සහ ඊට අයිති ගස්කොලන්, පළතුරු ආදී සෑම සියලු දේත් වේ.

මෙම ඉඩම තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ්228/173 හි 2005.09.16 දින ලියාපදිංචිව ඇත.

### දෙවැනි උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවාපත්තුවේ, ගලගම පිහිටි පැලවත්ත නමැති කුරක්කන් කුරුණි තුනක් *හෙවත්* කුරක්කන් කුරුණි එකහමාරක් පමණ වපසරිය ඇති ඉඩම බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ මහතා විසින් මැන සම්පාදිත 2003.06.10 දිනැති අංක 4945 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් පෙන්නුම් කෙරෙන ඉඩමට මායිම් උතුරට : වික්‍රමගෙවත්ත හා පාසල් මාවත ද, නැගෙනහිරට : පාසල් මාවත හා කුඩාවැව අත්මග ද, දකුණට : කුඩාවැව අත්මග හා කම්මල් ආර *නොහොත්* කම්මල්වල දෙනිය ද, බස්නාහිරට : පාවුලවත්ත හා වික්‍රමගෙවත්ත ද, යන සතර මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් තිස් නමයයි දශම හතක් (අක්කර 01, රූඩ් 01, පර්චස් 39.7) ක් විශාල ඉඩම සහ ඊට අයිති ගොඩනැගිලි, ගස්කොලන්, පළතුරු ආදී සෑම සියලුදේත් වේ. මෙම ඉඩම තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 248/78 හි ලියාපදිංචිව ඇත.

උපලේඛන 1 සහ 2 හි සඳහන් වනුයේ එකම ඉඩම වන අතර, ඒ බැව් 2005.09.15 දිනෙන් එච්. ඒ. අමරසේන මහතා විසින් ලියන ලද අංක 7893 දරන ප්‍රකාශන ඔප්පුවෙන් තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ජේ. රත්නායක
සභාපති,

2007 නොවැම්බර් මස 28 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන, මාතර,

03-61

---

## සබරගමුව සංවර්ධන බැංකුව

### 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තිය මගින් බලාත්මක කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ යෝජනා සම්මතය

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තිය මගින් බලාත්මක කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සබරගමුව සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2007.01.26 දින පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සබරගමුව සංවර්ධන බැංකුව වෙනුවෙන් රත්නපුර නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ඩී. වී. කේ. වීරසිංහ මහතා විසින් සහතික කරන ලද 2005.11.15 දින හා අංක 469 දරන උකස් ඔප්පුව ප්‍රකාර අයවිය යුතු මුදල් ගෙවීම වටාපොත, කිරිබත්ගල, පාසල අසලහි පදිංචි කලප්පු තන්ත්‍රිගේ දොන් නිහාල් තිස්ස/කලප්පු තන්ත්‍රිගේ දොන් තිස්ස බණ්ඩාර යන අය පැහැර හැර ඇති බැවින්, එකී උකස්කරය යටතේ සබරගමුව සංවර්ධන බැංකුවට අයවිය යුතු රුපියල් දෙලක්ෂ හතලිස්දහස් නවසිය තිස්හතයි ශත විසි එක (රු. 240,937.21) ක මුදල හා 2006.12.07 දින සිට වාර්ෂිකව 22% බැගින් වෙන්දේසි දිනය තෙක් දෙලක්ෂ තිස්තුන් දහස් අටසිය පනස් හතයි ශත පනස් දෙක (රු. 233,857.52) ක මුදල සඳහා පොලිය ද, පිරිවැටුම් බදු, ආරක්ෂක බදු හා දැන්වීම් ගාස්තු ඇතුළු වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර අයකර ගැනීම සඳහා කැස්බෑව, වලව්වත්ත, ධම්මිකා, 228/ඒ හි පදිංචි බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතා විසින් එකී අංක 469 දරන උකස්කරය මගින් සබරගමුව සංවර්ධන බැංකුවට උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුය.

### උපලේඛනය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ මැද පත්තුවේ, කිරිබත්ගල තිබෙන සකින්වත්ත නම් වූ උතුරට : ඉලුක්වත්ත ද, නැගෙනහිරට : දොල ද, දකුණට : හාලිගේ වත්ත ද, බස්නාහිරට : ගල්වැට ද, මායිම් වූ කුරක්කන් සේරු 3ක් පමණ විශාලත්වය ඇති ඉඩමේ කොටසකට අවසරලත් මිනින්දෝරු එම්. එස්. දියගම මහතා විසින් මැන සාදන ලද අංක 5491 සහ 2004.06.27 දින දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් සවිස්තරව පෙන්නුම් කෙරෙන උතුරට : ඉලුක්වත්ත ද, නැගෙනහිරට : සකින්වත්ත කොටසක් ද, දකුණට : හාලිගෙවත්ත සහ පාර ද, බස්නාහිරට : හාලිගෙවත්තට ද මායිම් වූ අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් පහළොවක් (අක්. 01, රූඩ්. 02, පර්. 15) විශාල ඉඩම හා ඊට අයත් සියලුම දේ වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරී,
ඒ. බී. ආරියරත්න.

සබරගමුව සංවර්ධන බැංකුව,
අංක 28, බණ්ඩාරනායක මාවත,
රත්නපුර.

03-57

---

## සෙලාන් බැංකුව පීඑල්සී-මිලේනියම් ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 ජනවාරි මස 17 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0860-01472229-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. ආර්. පුෂ්පා කුමාරි විසින් සහතික කරන ලද 2004.04.26 දිනැති අංක 351 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පොල්ගහවෙල පදිංචි ලලිතා එලිසබත් නැතැනියල් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්ලක්ෂ විසිඅට දහස් හයසිය තිහයි ශත දහහතරක (රු. 30,28,630.14) මුදලක්, 2007 සැප්තැම්බර් මස 27 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 30,28,630.14 මුදල ද, 2007 සැප්තැම්බර් මස 28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් හතරක් (34%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 351 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉහත සඳහන් උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ දැන් උඩපොල ඕකොව කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්ගහවෙල සුළු නගර සභා සීමාව තුළ පොල්ගහවෙල කෑගල්ල පාර දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පද්මදාස විසින් සාදන ලද 2002 ජූනි මස 25 දිනැති අංක 2532සී දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රදල්ලහේන දැන් වත්ත නමැති ඉඩමේ කැබැලි අංක 1 ලකුණු කළ වරිපනම් අංක 221 දරන (බලයලත් මිනින්දෝරු සරත් වෙලගෙදර විසින් සාදන ලද 1980 දෙසැම්බර් 09 දිනැති අංක 2022ඒ දරන සැලැස්මේ කැබලි අංක 1 ලකුණු කළ ඉඩම් කොටසේ නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2532 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 10 ද, නැගෙනහිරට : අංක 2532 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 2 ද, දකුණට : මහා මාර්ගය සහ බස්නාහිරට : අංක 2532 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 10 ද, යන මායිම් තුළ එකී අංක 2532සී දරන සැලැස්ම අනුව පර්චස් විස්සයි දශම හයයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 20.62) විශාල, ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම.

බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පද්මදාස විසින් සාදන ලද 2002 ජනවාරි මස 15 වැනි දිනැති අංක 2532 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 10 ලකුණු කළ (ප්‍රවේශ මාර්ගය 4.0 මීටර් සහ 9.0 මීටර් පළල) ඉඩම් කොටස තුළ, උඩින් සහ දිගේ අයිතිය සමඟ.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

03-129

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

#### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 1112001614.

2007 නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. සී. නානායක්කාර විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ ද. 2005 මැයි මස 3 වැනි දින හා අංක 7480 ද, 2005 අගෝස්තු මස 01 වැනි දින හා අංක 7741 දරන සහ 2006 පෙබරවාරි මස 07 වැනි දින හා අංක 8196 ද, දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සේයඩ් මොහොමඩ් රිස්මි මව්ලානා ණයකරු හැටියට ද, පැහර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහසය ලක්ෂ තිස් හයදහස් හාරසිය අසූ හයයි ශත තුනක (රු. 1,636,486.03) මුදලක් 2007 මැයි මස 08 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දහසය ලක්ෂ තිස්හය දහස් හාරසිය අසූ හයයි ශත තුනක (රු. 1,636,486.03) මුදල ට 2007 මැයි මස 09 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,380,781.84 ක මුදල මත 20%ක වැඩිපුර වාර්ෂික පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 7480, 7741 සහ 8196 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කොට ඇත්තා වූ ද. මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද. දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝර්ප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### ඉහත සඳහන් උපලේඛනය

බලයලත් මානක ජේ. ධර්මපාල විසින් සහතික කරන ලද 1972 ජූනි මස 2 වැනි දින හා අංක 1042 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, වැලිගම් කෝරළේ, වැලිගම නගර සභා සීමාව තුළ පොන්හෙට්ටිමුල්ල පිහිටි ගල්බොක්ක පාරේ වරිපනම් අංක 231 සහ 231/5 දරන ආරච්චිගෙවත්ත ඉඩමේ ලොට් 3 සහ පල්ලියගුරුගෙවත්ත ඉඩමේ ලොට් ඒ දරන කොටසේ ලොට් 2 කියන ඒකාබද්ධ ඉඩමේ භූමිය වගාවන් සහ සියලුදේත් සමඟ බෙදා වෙන් කරන ලද ලොට් 3 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට: පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 5 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 4 සහ 5 ද සහ පල්ලියගුරුගෙවත්ත ඉඩමේ ලොට් 1 ද, දකුණට : පල්ලියගුරුගෙවත්ත ඉඩමේ ලොට් 1 සහ ඉස්කෝලෙ වත්ත ද බස්නාහිරට : ඉස්කෝලේවත්ත සහ අංක 1042 දරන පිඹුරේ ලොට් 2 ද යන මායිම් තුළ පර්චස් දාහතයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 17.7) විශාල ඉඩම සහ එකී අංක 1042 දරන පිඹුරේ පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 5 දරන කොටස ඔස්සේ ගමන් කිරීමේ අයිතිය ද සමඟ වේ. මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 673/233 වෙළුමේ පිටුව යටතේ ලියාපදිංචි වී ඇත.

ආර්. ආර් දුනුවිල,
සමාගම් ලේකම්.

03-156

### මහජන බැංකුව - තල්ගස්වල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.11.23 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2006.02.14 දිනැති අංක 453 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්. මතුගම, බෙන්තොට, අගලවත්ත පාර, අංක 310 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි අංක එන්(පීවීඑස්) 36084 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි ස්ථාපිත සමාගමක් වන සී/ස. රේවන ඔටෝ සර්විස් ඇන්ඩ් ටී ෆැක්ටරි (පුද්ගලික) සමාගම බන්ධනදායී සමාගම වශයෙන් ගෙවීම පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්කෝටි තුන් ලක්ෂ හයදහස් දෙසිය තිස් හතයි ශත අසූ හය (රු.1,306,237.86) ක මුදල මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2007.05.09 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් එක්කෝටි තුන් ලක්ෂ හයදහස් දෙසිය තිස් හතයි ශත අසූ හය (රු.1,306,237.86) ක මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද, සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්කෝටි තුන් ලක්ෂ හයදහස් දෙසිය තිස් හතයි ශත අසූ හය (රු.1,306,237.86) ක මුදල් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 453 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පස්දුන් කෝරළේ, බටහිර ඉද්දගොඩ පත්තුවේ හොරවල ගමේ පිහිටි කටුවලගොඩවත්ත නමැති ඉඩමේ කැබලි අංක 26බී, කැබලි අංක 26ඒ හි කොටසක් සහ කැබලි අංක 29ඊ දරන කැබලි ඒකාබද්ධ කරන ලද අංක ඒ1 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් 2001.10.12 දින මැන සහතික කරන ලද අංක 998/2001 දරන පිඹුර ප්‍රකාර ඒ1 දරන කැබැල්ලට මායිම් උතුරට: අංක 1403 පිඹුරෙහි නිරූපිත කැබලි අංක 29එෆ්, 29සී, සහ 29ඩී ද, නැගෙනහිරට : පාර, අංක 1153 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක 28 සහ අංක 1464 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක 26බී දරන කැබලි ද, දකුණට : අංක 1153 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක 28, අංක 1464 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක 26බී සහ අංක 1153 පිඹුරෙහි නිරූපිත කැබලි අංක 27 සහ පිඹුරු අංක 3009 හි නිරූපිත ඒ දරන කැබැල්ල ද, බස්නාහිරට : අංක 3009 දරන පිඹුරෙහි නිරූපිත ඒ අක්ෂරය දරන කැබැල්ල සහ පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි, පර්චස් විසිහයයි දශම පහයි එක (අ. 0, රූ. 2, පර්. 26.51) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි, ගහකොළ ආදී සියලු දේද වේ. මෙම ඉඩම මතුගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 401/42 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත ඉඩම පහත ඉඩම් කැබැලි සම්බන්ධ කර සකස් කරන ලද ඉඩමක් බැවින් නිසි හරස් සටහන් මගින් සම්බන්ධ කරන්නේ නම් මැනවි.

ඉහත කී හොරවල ගමේ පිහිටි කටුවලගොඩවත්ත නමැති ඉඩමේ 29ඊ දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු කේ. ජේ. එල්. විජේනායක මහතාගේ 2001.01.21 දිනැති අංක 1403 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අංක 29සී සහ 29ඩී ද, නැගෙනහිරට : පාර ද, දකුණට : මෙම ඉඩමේ අංක 26 දරන කැබැල්ල ද, බස්නාහිරට : අංක 29එෆ් දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහ අටක් (අ. 0, රූ. 0, පර්. 18) විශාල ඉඩම. මෙම ඉඩම මතුගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී353/126 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී හොරවල ගමේ පිහිටි කටුවලගොඩවත්ත නමැති ඉඩමේ 26බී දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු කේ. ජේ. එල්. විජේනායක මහතාගේ 2001.01.21 දිනැති අංක 1464 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට අංක 26ඒ දරන කැබැල්ල ද, නැගෙනහිරට අංක 1153 දරන පිඹුරේ නිරූපිත අංක 28 දරන කැබැල්ල සහ පාසැල හිමිකම් කියන ඉඩම ද, දකුණට පාසැල හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට අංක 1153 දරන පිඹුරේ නිරූපිත අංක 26 සහ 27 දරන කැබැලි ද, යන මායිම් තුළ පිහිටි පර්චස් හතරයි දශම බිංදුවයි තුනක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 4.03) විශාල ඉඩම. මෙම ඉඩම, මතුගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී355/254 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී හොරවල ගමේ පිහිටි කටුවලගොඩවත්ත නැමති ඉඩමේ ලොට් 26 බෙදූ ඒ දරන ඉඩම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු කේ. ජේ. එල්. විජේනායක මහතාගේ 2001.01.21 දිනැති අංක 1464 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතරට අංක 1153 දරන පිඹුරේ නිරූපිත අංක 29 දරන කැබැල්ල ද, නැගෙනහිරට පාර, අංක 1153 දරන පිඹුරේ නිරූපිත අංක 27,28 දරන කැබලි සහ පාසැල් වත්ත සහ 26බී ද, දකුණට අංක 27,28,40 දරන කැබැලි සහ අංක 1153 දරන පිඹුරේ නිරූපිත 26බී දරන කැබැල්ල ද, බස්නාහිරට පාර සහ අංක 1153 දරන පිඹුරේ නිරූපිත අංක 27 දරන කැබැල්ල ද, යන මායිම් තුළ පිහිටි රූඩ් තුනයි පර්චස් විසිතුනයි දශම දෙකයි අටක් (අක්කර 0, රූඩ් 3, පර්චස් 23.28) (ඉවත් කරන ලද රූඩ් එකයි පර්චස් දහනවයයි දශම බිංදුවයි හතක් (අක්කර 0, රූඩ් 1, පර්චස් 19.07) විශාල ඉඩම. මෙම ඉඩම, මතුගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී378/147 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කලමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

03-136

---

### මහජන බැංකුව - කොබෙයිගනේ 281 ශාඛාව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. දයානි පෙරේරා මිය විසින් සහතික කරන ලද 2004.06.07 දිනැති අංක 849 දරන

උකස්කරය ප්‍රකාර ගෙවීම් වර්ණසූරිය ඉලංගසිංහ ජයතිලක මුදියන්සේලාගේ ඥාණතිලක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ, රුපියල් හාරලක්ෂ හැට දෙදහස් හාරසිය පනස් තුනක් (රු. 462,453) මුදලක් දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2005.10.30 දින සිට වර්ෂයකට සියයට දහඅටයි දශම දෙකයි පහ (18.25%) බැගින් රුපියල් හාරලක්ෂ හැට දෙදහස් හාරසිය පනස් තුනක් (රු. 4,62,453) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් හාරලක්ෂ හැට දෙදහස් හාරසිය පනස්තුනක් (රු. 4,62,453) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල මහතා විසින් එකී අංක 849 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ 29ඩී (29D) වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත් පත්තුවේ, බළදොර කෝරළේ, සියඹලාගස්වැටිය ගමෙහි පිහිටි "ඉලංකානිහේන දැනට වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක මහතා විසින් මැන සාදන ලද අංක 3725/97 දරන 1997.12.02 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 01 දරන ඉඩමට මායිම්, උතුරට : සරත් විජේසිංහට අයත් ඉඩම, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් අංක 02 හා 03, දකුණට : විජේදාසට අයත් ඉඩම, බස්නාහිරට : දයාරත්නට අයත් ඉඩම යන මායිම් තුළ පිහිටි, ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි, රූඩ් එකයි, පර්චස් තුනයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 3.5) විශාල ඉඩම හා ඒ තුළ පිහිටි ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී/1136/254 හි ලියාපදිංචි වී ඇත.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත් පත්තුවේ, බළදොර කෝරළේ, සියඹලාගස්වැටිය ගමෙහි පිහිටි "ඉලංකානිහේන දැනට වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක මහතා විසින් මැන සාදන ලද අංක 3725/97 දරන 1997.12.02 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 02 දරන ඉඩමට මායිම්, උතුරට : සරත් විජේසිංහට අයත් ඉඩම, නැගෙනහිරට : වලස්වැව සිට කුඩා ඔයට යන මාර්ගය, දකුණට : ඉහත පිඹුරේ ලොට් 03 (අඩි 8 පාරක් සඳහා වෙන් කළ කොටස), බටහිරට : ඉහත පිඹුරේ ලොට් 01 යන මෙකී මායිම් තුළ වූ අක්කර බින්දුවයි, රූඩ් එකයි, පර්චස් තුනයි දශම පහ (අ. 0, රූ. 1, පර්. 3.5ක්) විශාල ඉඩම සහ ඊට අයත් ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේද සමග වේ. (එෆ් 1136/255 - කුරුණෑගල)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 210, කොළඹ පාර,
වැහැර, කුරුණෑගල.

03-137

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.
5. සියලුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.
7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි.

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණන ගැසට් පිටුවකටම | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ)

11. සෑම සිකුරාදා දියකටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි
13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව * :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට<br>රු. ශ. | පිටරට<br>රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II, III ජේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වැනි කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වැනි ඡේදය | 520 0 | 1,007 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 9 |
| III වැනි ඡේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ ගාස්තුව<br>රු. ශ. | තැපැල් (මෙරටඃ<br>රු. ශ. |
|---|---|---|
| (අ) I වැනි කොටස | 31 0 | 5 0 |
| II වැනි කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් ක | 11 0 | 5 0 |
| (ආ) I වැනි ඡේදය | 10 0 | 5 0 |
| II වැනි ඡේදය | 12 0 | 5 0 |
| III වැනි ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05 පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2008** | | | |
| මාර්තු | 2008.03.07 | සිකුරාදා | 2008.02.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.14 | සිකුරාදා | 2008.02.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.19 | බදාදා | 2008.03.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.28 | සිකුරාදා | 2008.03.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2008.04.04 | සිකුරාදා | 2008.03.19 | බදාදා | දහවල් | 12.00 |
| | 2008.04.11 | සිකුරාදා | 2008.03.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.04.18 | සිකුරාදා | 2008.04.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.04.25 | සිකුරාදා | 2008.04.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2008.05.02 | සිකුරාදා | 2008.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.05.09 | සිකුරාදා | 2008.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.05.16 | සිකුරාදා | 2008.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.05.23 | සිකුරාදා | 2008.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.05.30 | සිකුරාදා | 2008.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.